**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය** / Editors
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක** /Asst Editor
**ක්‍රීඩා සංස්කාරක** / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා** / Graphics
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ**/ Photography
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම්** / Advrertising
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

# සන්නස
## පාඨක අනුග්‍රාහක
## ඔබ සැමට
## සුබ නව වසරක් වේවා...!



සේයාරුව - මහීල් මුණිදාස



# මොනවද වුණේ - මොනවද නොවුණේ

**ජයතිලක කම්මැල්ලවීර**



**'මෛත්‍රී ජනාධිපති වෙලා අවුරුද්දක් ගෙවුණා මොනවද වුණේ?'**

මේ ප්‍රශ්නය විවිධ හඬවල්වලින් රට හැම තැන ඇසෙයි. සමහරු අහන්නේ 'ක-න්ඩියටය'. අපේම සමහරු කළකිරීමෙන් සහ අපේක්ෂාභංගත්වයෙන් මේ ප්‍රශ්නය අසති. තවත් සමහරු හැකිතරම් ඉක්මණින් තමන්ට කිසියම් බලයක් ලබාගැනීම වෙනුවෙන් මෙය අසනු අපට ඇසෙයි.

ගතවූ වසර තුළ වටිනා බොහෝ දේ සිදුවී තිබේ. සිදුවිය යුතුව තිබුණු එහෙත් සිදු නොවුණු දේ ද බොහෝය. එසේම මෛත්‍රී පාලනය යටතේ කිසිසේත් සිදු නොවිය යුතු යයි යුත්තිගරුක ජනතාව සිතූ මුත් සිදුවූ එවැනි දේද බොහෝය. යහපත් සමාජයක් පතන ජනයා ඉදිරියේදී සිදුවිය යුතු යයි සිතන දේ තවත් බොහෝය.

## සිදුවූ යහපත් දේ කවරේද යත්....

මේ සියල්ල කතා කරන්නට මෙහි ඉඩක් නැත. එහෙයින් මේ මොහොතේ ඉතා වැදගත් යයි මට සිතෙන කරුණු දෙකතුනක් පමණක් තෝරා ගනිමි.

සිදුවූ යහපත් දේ ලැයිස්තු ගත කරන විට බොහෝ විට මුලට එන්නේ 19 වන ව්‍යවස්ථා සංශෝධනයයි. එයින් යම් ප්‍රමාණයකට ජනාධිපති බලතල සීමා වීම සහ ස්වාධීන කොමිෂන් සභා පත්වීමයි. එහෙත් මගේ ප්‍රථම අවධාරණය වන්නේ රටතුළ ගොඩනැගුණු නිදහස් වාතාවරණයයි. බියෙන් සැකෙන් තොරව ජීවත්වීමේ නිදහස ගැන කතා කරන විට බොහෝ දෙනාගේ කටට එන්නේ යුද්ධය අවසන් වීම

12 වන පිටට